මගේ අංකය: SP/PSC/34/LI/39/01
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
6වන මහළ, ගාල්ල.
2020.11.27

ලේකම්,
කෘෂිකර්ම/ධීවර/අධ්‍යාපන අමාත්‍යාංශය,
දකුණු පළාත

**දකුණු පළාත් තාක්ෂණ සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ**
**සීමිත තරග විභාගය - 2020/2021**

Limited Competitive Examination for Recruitment to the Post of Technical Service in Southern Province-**2020/2021**

**** විශේෂයෙන් සැළකිය යුතුයි ****

මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (**www.psc.sp.gov.lk**) හරහා අනිවාර්යයෙන්ම ලියාපදිංචි වී අයදුම්කළ යුතුය.

1.0 අංක 222 හා 2017.05.24 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2017.08.10 දිනැතිව සංශෝධිත දකුණු පළාත් රාජ්‍ය සේවයේ - තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව හා අංක 291 හා 2018.12.31 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2020.11.03 දිනැතිව සංශෝධිත දකුණු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුව දකුණු පළාත් තාක්ෂණ සේවයේ පහත දක්වා ඇති තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020/2021 සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2020.12.24 දින වන අතර මෙම විභාගය 2021 වර්ෂයේ මුල් කාර්තුවේදී ගාල්ල නගරයේ දී පැවැත්වීමට දැනට සැලසුම් කර ඇත. පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | තනතුරු නාමය ඉංග්‍රීසියෙන් | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කෘෂිකර්ම උපදේශක | Agricultural Instructors | 11 |
| 02 | සත්ත්ව සංවර්ධන උපදේශක | Live stock Development Instructors | 13 |
| 03 | ජනපද නිලධාරි | Colonization Officer | 07 |

| ශ්‍රේණිය | ශ්‍රේණිය ඉංග්‍රීසියෙන් |
|---|---|
| III ශ්‍රේණිය | Grade III |

**2.0** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති විවෘත අයදුම්කරුවන් දිස්ත්‍රික් අනුපාතය අනුව බඳවා ගැනීම සිදු කෙරේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් විවෘත තරඟ විභාගයෙන් හා 30% ක් සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනේ. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

සටහන -

- III / II / I යන ශ්‍රේණීන් හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.
- සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශත සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.
- පුරප්පාඩු සංඛ්‍යාව 3 ට අඩු නම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

3.0 **වැටුප් ක්‍රමය:-** අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් තාක්ෂණ සේවයේ තනතුරු සඳහා MN 3- 2016 වන අතර මාසික වැටුප් පරිමාණය 31,040 - 445x10-660x11-730x10-750x10- 57,550/- වේ.

**4.0** සුදුසුකම් :- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ප්‍රථම පහත සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**<u>III ශ්‍රේණියේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා</u>**

**(අ). අධ්‍යාපන සුදුසුකම්**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව. ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම.

**(ආ). පළපුරුද්ද**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක, දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**(ඇ). වෘත්තීය සුදුසුකම්**

i. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 (හය) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම,

හෝ

ii. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳව දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

iii. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

vi. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

v. රජය විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

vi. ඉහත සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි ශ්‍රීලංකා තාක්ෂණ සේවක මණ්ඩලය විසින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

<u>**III ශ්‍රේණියේ සත්ත්ව සංවර්ධන උපදේශක හා ජනපද නිලධාරි තනතුරු සඳහා**</u>

**(අ). අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව. ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම.

**(ආ). පළපුරුදුද:**

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**(ඇ). වෘත්තීය සුදුසුකම්:**

i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම / සත්ත්ව පාලන ඩිප්ලෝමාව

හෝ

ii. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබිය හැකි ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

**කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**වෙනත් සුදුසුකම්** :

i. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

ii. නියමිත දිනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

iii. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

## 5.0 විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විෂයය | ලකුණු | කාලය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය<br>(Intelligent Test) | 100 යි | පැය 01 යි |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය<br>(Subjective Technical Test) | 100 යි | පැය 02 යි |

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට වෙන් කර ඇති ලකුණුවලින් 40% ක් බැගින් වත් ලබාගත යුතු ය.

ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

ඉහත විෂයට  අදාළ විෂයය නිර්දේශ පහත පරිදි වේ.

තනතුර:- කෘෂිකර්ම උපදේශක

| විෂයය | විෂයය නිර්දේශ |
|---|---|
| බුද්ධි පරීක්ෂණය<br>(Intelligent Test) | අපේක්ෂකයා සතු සමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය<br>(Subjective Technical Test) | තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>**1.** ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ  දායකත්වය.<br>1.1. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය,<br>1.2. රැකියා වියුක්තිය,<br>1.3. කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්වය.<br>**2.** ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම.<br>**3.** පස හා ශාක පෝෂණය<br>3.1. පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම.<br>3.2. ශාක පෝෂණය, පාංශු/ ශාක පෝෂණය කළමනාකරණය<br>**3.3.** පැලැටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br>**4.** වී නිෂ්පාදනය<br>4.1. පාංශු දේශගුණික අවශ්‍යතාවය<br>4.2. ප්‍රභේද<br>4.3. බිම් සකස් කිරීම හා තවාන් පාලනය.<br>4.4. පළිබෝධ හා රෝග මර්ධනය<br>4.5. පොහොර යෙදීම<br>4.6. ජල කළමනාකරණය/ අස්වනු වැඩි කර ගැනීමේ නූතන ක්‍රමවේදය.<br>4.7.අස්වනු නෙළීම හා පසු තාක්ෂණය.<br>4.8. බිත්තර වී නිෂ්පාදනය<br>**5.** වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය<br>5.1. ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු සහ වෙනත් භෝගවල ප්‍රභේද<br>**6.** එළවළු නිෂ්පාදනය<br>6.1. එළවළු තවාන් පාලනය<br>6.2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම.<br>**7.** පළතුරු<br>7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම. |

| | |
|---|---|
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subjective Technical Test) | **8.** භෝග ආරක්ෂණය.<br>8.1. භෝග වගාවට වැළඳෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම ඒවායේ පාලන විධි.<br>8.2. වල් මර්ධනය, වල් මර්ධන ක්‍රම<br>8.3. පළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම.<br><br>**9.** පාංශු රසායන<br>9.1. පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම<br>**10.** වාරිමාර්ග හා ජල කළමනාකරණ<br>10.1. විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>10.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම<br>10.3 ජල වහනය හා එහි වැදගත්කම<br>**11.** ගොවිපල් යාන්ත්‍රිකරණය<br>11.1. ගොවිපල් යාන්ත්‍රිකරණයේ වාසි අවාසි<br>11.2. බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>11.3. ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>11.4. ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව<br>**12.** මී මැසි පාලනය<br>12.1. ආර්ථික වැදගත්කම<br>12.2. මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම.<br>12.3. අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම.<br>**13.** මල් වගාව හා භූමි අලංකරණය<br>13.1. ආර්ථික වැදගත්කම<br>13.2. භූමි අලංකරණ ක්‍රම<br>13.3.වෙළඳ පොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳ පොළට සකස් කිරීම<br>14. ආරක්ෂිත ගෘහතුල භෝග වගාව<br>14.1. වැදගත්කම<br>14.2. සැලසුම් කිරීම<br>14.3. භෝග තෝරා ගැනීම, ජලය/ පොහොර යෙදීම<br>14.4. පවත්වා ගෙන යාම හා අස්වනු සකස් කිරීම<br>15. සත්ව පාලනය<br>15.1. කුකුළු පාලනය හා කිරි ගව පාලනය<br>15.2. සමෝධාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ව නිෂ්පාදන පවත්වා ගැනීම<br>16. කෘෂිකාර්මික ව්‍යාපෘතිය<br>16.1. කෘෂිකාර්මික ව්‍යාපෘති උපාය මාර්ග හා ක්‍රමවේදය<br>16.2. කෘෂිකාර්මික ව්‍යාපෘති සන්නිවේදන ක්‍රම<br>17. පටක රෝපණය<br>17.1. පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම,<br>17.2. පටක රෝපණයේ භාවිතයන්/ යෙදිම්,<br>17.3.පටක රෝපණයේ වාසි අවාසි, |

| | |
|---|---|
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subjective Technical Test) | 18. පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම<br>18.1. පැලෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම,<br>18.2. පැලෑටි නිරෝධායන ක්‍රම<br>19. ශාක සංරක්ෂණය<br>19.1. ශාක සංරක්ෂණයේ වැදගත්කම(ශාබ/ ජාන ප්ලාස්ම)<br>19.2 ශාක සංරක්ෂණ ක්‍රම (ශාබ/ ජාන ප්ලාස්ම)<br>**20.** ජෛව තාක්ෂණය<br>**20.1. DNA** වල වැදගත්කම<br>**20.2.** ජානය යනු කවරක්ද, එහි ක්‍රියාකාරීත්වය<br>**20.3.** ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව<br>**21.** කෘෂිව්‍යාවසායකත්වය<br>**21.1** අලෙවිකරණ දැනුම<br>**21.2** අගය එකතු කළ නිෂ්පාදන<br>**21.3** කෘෂි නිෂ්පාදනයන්හි අගයදාම සංවර්ධනය<br>**21.4** කෘෂි නිෂ්පාදනයන්හි මිල තීරණය.<br>22. කාබනික වගාව<br>22.1 වැදගත්කම<br>22.2 වාසි/ අවාසි<br>23. සහතික කරණය<br>23.1 **GAP**<br>23.2 **GMP**<br>23.3 **HACCP**<br>23.4 **Organic Certificate**<br>24. ආහාර තාක්ෂණය<br>24.1 ආහාර සැකසීමේ තාක්ෂණ ක්‍රමවේද<br>24.2 ලේබලයක ඇතුලත් විය යුතු කරුණු<br>24.3 නවීන ඇසුරුම්කරණ ක්‍රමවේද හා එහි වාසි<br>25. කෘෂිකර්ම සංවර්ධනය -<br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති. ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්ය භාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට අධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්. |

**තනතුර:- සත්ත්ව සංවර්ධන උපදේශක**

| විෂයය | විෂයය නිර්දේශ |
|---|---|
| බුද්ධි පරීක්ෂණය (Intelligent Test) | අපේක්ෂකයා සතු සමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

| | |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subjective Technical Test) | 1. ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික හා සත්ත්ව පාලන කටයුතු පිළිබඳව පවත්නා සම්පත් විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය<br>2. ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම,<br>3. ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව ගොවිපල රටා, ඒවායේ පිහිටීම හා විසිරීම<br>4. ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදා ගන්නා ක්‍රම<br>5. බෝවන සත්ත්ව රෝග මර්දන ක්‍රියා පිළිවෙත්, රෝගී සතුන්ගේ නියැදි රැස් කිරීම හා ප්‍රවාහනය<br>6. ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රීකරණ ක්‍රම<br>7. සත්ත්ව පාලනය හා ආශ්‍රිත කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, බිත්තර නිෂ්පාදනය හා සත්ත්ව ආහාර නිෂ්පාදනය<br>8.සත්ත්ව පාලනය හා ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ත්ව ගොවිපල සැලසුම්කරණය<br>9. විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායිතාවයන්<br>10. තෘණ හා රණිල වගාව ආශ්‍රිත කරුණු හා ආහාර සංරක්ෂණය |

**තනතුර:- ජනපද නිලධාරි**

| විෂයය | විෂයය නිර්දේශ |
|---|---|
| බුද්ධි පරීක්ෂණය (Intelligent Test) | අපේක්ෂකයා සතු සමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subjective Technical Test) | ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා එහි විකාශය, ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණය හා ව්‍යාපාර, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය සහ ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ ව්‍යුහගත ශෛලියේ ප්‍රශ්න පත්‍රයකි. පහත විෂයන් පිළිබඳ සරල අවබෝධයක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වේ.<br>i. ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා එහි විකාශය<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ ඉතිහාසය<br>- ලේඛන ලියාපදිංචි කිරීම මගින් ඉඩම් අයිතිය තහවුරු කිරීම<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම ලියාපදිංචි කිරීම<br>ii. ශ්‍රී ලංකාවේ ඉඩම් නීතියට අදාල ප්‍රධාන පනත්<br>- බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් හඳුන්වා දුන් මුඩුබිම් ආඥා පනත හා එමගින් ඇති වූ සමාජ වෙනස් කම්<br>- 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත ආරම්භ වීම හා ගොවි ජනතාවට ඉඩම් වල අයිතිය ලබා දීම.<br>- 1947 අංක 8 දරණ රජයේ ඉඩම් ආඥා පනත ආරම්භ වීම හා එමගින් ලංකාවේ ඉඩම් කළමනාකරණයට සිදු වූ සංශෝධන<br>iii. ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම<br>- ජනපද ව්‍යාපාර පිහිටුවා ඇති ස්ථාන<br>- මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ<br>iv. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම<br>- අනිලමානය, රෝඩ් රේසරය, ඩම්පිලෙවලය, තියෝඩර් ලයිටරය<br>- 1:50,000 – 1:10,000 අඟලේ සිතියම හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තරය |

| | |
|---|---|
| | v. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳව හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම,<br>- ඉඩම් වර්ග<br>රජයේ ඉඩම්, පුද්ගලික ඉඩම්, ප්‍රවේණි ඉඩම්<br>vi. රජ සමයේ සිට මේ දක්වා ඉඩම් වල අයිතිය බැහැර කිරීමට යොදා ගත් ලේඛන පිළිබඳ අවබෝධය<br>- සන්නස් නින්දගම්<br>- බදූකර, ස්වර්ණභූමි, ජයභූමි, රත්න භූමි, රන්බිම<br>vii. සාමාන්‍ය කළමනාකරණයට හා මහජන සම්බන්ධතා පිළිබඳ තීරණ ගැනීමට අදාල සිද්ධි අධ්‍යනයන් |

**6.0** **විභාග ගාස්තු:-** විභාග ගාස්තුව **රු. 600/- කි**. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර**,** විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාල වලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.

**7.0** **අයදුම්පත්‍ර**

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (**www.psc.sp.gov.lk**) හරහා මාර්ගගත ලෙස (**Online**) අනිවාර්යෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, ඒ 4 (**සෙ.මී.21x29**) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දෘඩ පිටපතක් (Hard Copy) සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2020.12.24** දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දෘඩ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් තාක්ෂණ සේවයේ (කෘෂිකර්ම උපදේශක/ සත්ත්ව සංවර්ධන උපදේශක/ ජනපද නිලධාරි) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020/2021"** යන්න සඳහන් කරන්න.

ලේකම්**,**
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**,**
6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය**,**
ගාල්ල.

**7.1** අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වීමේදී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රීය ජංගම දුරකතන අංකයක් හා විභාග ගාස්තු ගෙවූ රිසිට් පතද තිබීම අත්‍යාවශ්‍ය වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව ලැබෙන නියමිත අයදුම්පත්‍රයට අනුකූල නොවන**,** නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ළඟ තබා ගත යුතුවේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ( **www.psc.sp.gov.lk**) මඟින් ලබා ගත හැකි අතර එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

**7.2** නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තැපැල් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**8.0** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii.) වලංගු රියදුරු බලපත්‍රය

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තැපැල් මගින් එවනු ලබන අතර. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකථන අංක **091-2234309 / 0912248450** ඔස්සේ දැන්විය යුතුය.

I. විභාගයේ නම

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම

III. සම්පූර්ණ ලිපිනය

IV. ඉල්ලුම් පත් තැපැල් කළ කාර්යාලය හා ලියාපදිංචි කළ අංකය හා දිනය

V. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

**9.0 තෝරා ගැනීමේ ක්‍රමය**

සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

**10.0 සාවද්‍ය තොරතුරු සැපයීම**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**11.0** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**12.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ගාමිණී වීරවික්‍රම**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

**(සැලකිය යුතුයි - ඔබ කාර්යාලයට අනුබද්ධව ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු, මෙම විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් ඔවුන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.)**